# ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය

## ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේකය - 18

නිකුත් කළ දිනය - 2010.09.08

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ (භාණ්ඩ හා වැඩ) සමග පරිශීලනය කිරීම සඳහා පහත සඳහන් ඡේද වෙනුවට මෙම අතිරේකය භාවිතා කරන්න

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමු අංක 5.4.4
භාණ්ඩ සහ වැඩ කොන්ත්‍රාත්තු සඳහා අත්තිකාරම් ගෙවීම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමු අංක 5.4.6
වැඩ කොන්ත්‍රාත් සඳහා රඳවා තබාගැනීමේ මුදල්

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමු අංක 5.4.8
කාර්යය සාධන සුරක්ෂණය

## රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

## වැඩ සහ භාණ්ඩ කොන්ත්‍රාත්තු සඳහා අත්තිකාරම් ගෙවීම

**වැඩ සඳහා වූ ඕනෑම කොන්ත්‍රාත්තුවක් සඳහා අත්තිකාරම් ගෙවීම් කළ යුතු ආකාරය:**

පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත කොන්ත්‍රාත් මුදලින් (එම මුදලින් තාවකාලික මුදල් ප්‍රමාණයක් සහ හදිසි අවිනිශ්චිත අරමුදල් අඩු කිරීමෙන් පසු) සියයට විස්සක (20%) උපරිමයක් අත්තිකාරම් වශයෙන් ගෙවිය හැකිය.
කොන්ත්‍රාත්කරුට ගෙවීම්වලින් සියයට අනූවක් (90%) ගෙවීමට ප්‍රථමයෙන් අත්තිකාරම් මුදල් සම්පූර්ණයෙන් අය කර ගත යුතුය.

**භාණ්ඩ කොන්ත්‍රාත්තුවක් සඳහා අත්තිකාරම් ගෙවීම් කළ යුතු ආකාරය:**

ප්‍රසම්පාදන අස්ථිත්වයේ වාසියට ණයවර ලිපි විවෘත කළ යුතු බවට ලංසු කැඳවීමේ ලේඛනවල නියම කර ඇති විට, ඒ සඳහා වූ වියදම සැපයුම්කරු දැරිය යුතු අතර, ප්‍රසම්පාදන අස්ථිත්වයට පිළිගත හැකි සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත, ණයවර ලිපියේ වටිනාකමින් සියයට තිහක (30%) ට සමාන මුදලකට වැඩි නොවන මුදලක් ශ්‍රී ලංකා රුපියල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය හැකිය.

පහත සඳහන් නියෝජ්‍යායතන විසින් මෙහි යට දක්වෙන ආකෘතිය මත නිකුත් කරනු ලබන අත්තිකාරම් ගෙවීම් සුරක්ෂණය පිළිගනු ලැබේ.

පහත සඳහන් නියෝජ්‍යායතන විසින් නිකුත් කරනු ලබන අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණය පිළි ගනු ලබන නමුත්, මුල්ම ලිඛිත ඉල්ලීම ලද විගස සුරක්ෂණය කළ මුදල ගෙවීම සහ මුදල් ප්‍රමාණයේ වලංගු භාවය පිළිබඳව මෙම කාර්යය සංග්‍රහයේ පළ කොට ඇති ආකෘතියෙහි අන්තර්ගතයෙන් දැඩි බැහැර වීමකින් තොරව එම සුරක්ෂණ ඉදිරිපත් කර තිබිය යුතුය.

- ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක්;
- වෙනත් රටක මූලාශ්‍රිත බැංකුවක්, නමුත් සුරක්ෂණය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක බැංකුවක් විසින් තහවුරු කර තිබිය යුතුය.

කෙසේ වෙතත්, සුරක්ෂණ නිකුත් කරන අස්ථිත්වය විදේශීය රජයක අපනයන ණය නියෝජ්‍යායතනයක් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි ජාත්‍යන්තර මූල්‍ය ආයතනයක් නම් වෙනත් රටක පිහිටි බැංකුවක් විසින් නිකුත් කරන අත්තිකාරම් ගෙවීම් සුරක්ෂණ, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් තහවුරු කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

- ඉදිකිරීම් පිළිබඳ සුරක්ෂණ අරමුදල;
- රක්ෂණ නියෝජ්‍යායතනයක්;

කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීම සඳහා නියමිත කාල සීමාව දීර්ඝ කිරීමකදී ඒ ගැන අවධානයෙන් සිටිය යුතු ප්‍රසම්පාදන අස්ථිත්වය මෙම සුරක්ෂණය දීර්ඝ කරන ලෙස සුරක්ෂණකරුගෙන් ඉල්ලා සිටීම සඳහා පියවර ගත යුතුය. එබඳු ඉල්ලීමක් ලිඛිතව කළ යුතු අතර, සුරක්ෂණයෙහි තහවුරු කර ඇති වලංගු දින ඉකුත් වීමට පෙර කළ යුතු වේ.

දෝෂ කිසිවක් පිළිසකර කරනු ලබන තුරු, දෝෂ වගකීම් කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි කොන්ත්‍රාත්කරුට කළයුතු ගෙවීම්වලින් රඳවා තබා ගැනීමේ මුදලක් සියලුම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලින් අඩු කර ගතයුතුය. මිළ ගණන් උච්චාවචනයන් අනුව ගැලපුම් කිසිවක් කිරීම්, වැට් බදු අය කිරීම් සහ අත්තිකාරම් ගෙවීම් ආපසු අය කර ගැනීම් සිදු කිරීමට ප්‍රථමයෙන්, අතුරු ගෙවීම් කාලය තුළ (වැඩ බිමේ ඇති ද්‍රව්‍ය ඇතුළුව) සිදු කර ඇති වැඩ ජාලයෙන් රඳවා තබා ගැනීමේ මුදල් අයකර ගත හැකිය.

වැඩ භාරයට ගැනීමෙන් පසුව රඳවා ගත් මුදලින් සියයට පනහක් (50%) මුදා හැරිය හැකි වන අතර, දෙවන සියයට පනහ (50%) දෝෂ වගකීම් කාල පරිච්ඡේදය සාර්ථකව සම්පූර්ණ කළ පසු මුදාහරිනු ලැබේ. විකල්ප වශයෙන් වැඩ භාරයට ගැනීමෙන් පසු රඳවා තබාගත් මුදලින් දෙවන සියයට පනහ (50%) ඒ සමාන සුරක්ෂණයකින් ප්‍රතියෝජනය කිරීමට කොන්ත්‍රාත්කරුට අවසර දිය හැකිය.

එසේත් නොමැතිව, විකල්ප වශයෙන්, වැඩ සම්පූර්ණයෙන් අවසන් කළ පසු පහත දැක්වෙන ආකෘතිය ප්‍රකාරව යට සඳහන් නියෝජ්‍යාතන විසින් නිකුත් කරනු ලබන කොන්දේසි රහිත සහ අවලංගු කළ නොහැකි සුරක්ෂණයක් මත, රඳවා තබාගත් මුදලින් දෙවන භාගය ආපසු ගෙවීමට කොන්ත්‍රාත්කරුට අවසර දිය හැකිය.

පහත සඳහන් නියෝජ්‍යාතනය විසින් නිකුත් කරනු ලබන අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණ පිළිගනු ලබන නමුත්, මුල්ම ලිඛිත ඉල්ලීම ලද විගස සුරක්ෂණය කළ මුදල් ගෙවීම සහ මුදල් ප්‍රමාණයේ වලංගුභාවය පිළබඳව මෙම කාර්යය සංග්‍රහයේ පළ කොට ඇති ආකෘතියෙහි අන්තර්ගතයෙන් දැඩි බැහැරවීමකින් තොරව එම සුරක්ෂණ ඉදිරිපත් කර තිබිය යුතුය.

- ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වාණිජ බැංකුවක්,
- වෙනත් රටක මුලාශ්‍රිත බැංකුවක්, නමුත් සුරක්ෂණය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක බැංකුවක් විසින් 'තහවුරු' කර තිබිය යුතුය.

කෙසේ වෙතත්, සුරක්ෂණ නිකුත් කරන අස්ථිත්වය විදේශීය රජයක අපනයන ණය නියෝජ්‍යායතනයක් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි ජාත්‍යන්තර මූල්‍ය ආයතනයක් නම් වෙනත් රටක පිහිටි බැංකුවක් විසින් නිකුත් කරන රඳවා ගත් මුදල් සඳහා සුරක්ෂණ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් තහවුරු කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

- ඉදිකිරීම් පිළිබඳ සුරක්ෂණ අරමුදල :(Construction Guaranteed Fund)
- රක්ෂණ නියෝජ්‍යායතනයන් :

කොන්ත්‍රාත්තුවේ දෝෂ වගකීම් කාලසීමාව දීර්ඝ කිරීමකදී මෙම සුරක්ෂණය දීර්ඝ කරදෙන ලෙස ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් කොන්ත්‍රාත්කරු වෙතින් ඉල්ලා සිටිය යුතුය. එබඳු ඉල්ලීමක් ලිඛිතව කළයුතු වන අතර, සුරක්ෂණයෙන් තහවුරුව ඇති කල් ඉකුත්වීමේ දිනයට පෙර එය කිරීමට ප්‍රසම්පාදන අස්ථිත්වය වගබලා ගතයුතුය.

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමුව : 5.4.8**

**කාර්යය සාධන සුරක්ෂණය**

වැඩ :

(ආ) කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම උල්ලංඝනය කළහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට පහකට (5%) නොඅඩු මුදලක් කාර්යය සාධන සුරක්ෂණයක් වශයෙන් වැඩ සඳහා අවශ්‍ය වේ.

(ආ) මෙම සුරක්ෂණය පිළිගත හැකි ආයතනයක් විසින් නිකුත් කරන ලද කාර්යය සාධන සුරක්ෂණයක් මගින් ඉදිරිපත් කළයුතු අතර, එය වැඩ නිමකිරීමට අපේක්ෂිත දිනයෙන් ඔබ්බට දින 28 ක් දක්වා වලංගු විය යුතුය.

භාණ්ඩ :

(අ) භාණ්ඩ සැපයීම සඳහා වූ කොන්ත්‍රාත්වලදී, කාර්යය සාධන සුරක්ෂණය සඳහා වන අවශ්‍යතාවය අදාල භාණ්ඩ සඳහා පවත්නා වෙළඳ පොළ තත්ත්වයන් සහ වාණිජමය පරිචය මත රඳා පවතියි.

(ආ) කොන්ත්‍රාත්තුවේ කාර්යය සාධනය අසාර්ථක වන විට, ප්‍රසම්පාදන අස්ථිත්වයේ ආරක්ෂාව සැලසීම සඳහා කාර්යය සාධන සුරක්ෂණයක් සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරේ.

(ඇ) ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට දහයකට (10%) නො අඩු යෝග්‍ය මුදල්මය සුරක්ෂණයක් මගින් වගකීම් පිළිබඳ බැඳීම් ආවරණය කරනු ලැබිය හැකිය.

(ඇ) යම් වගකීම් පිළිබඳ බැඳීමේ අවශ්‍යතාවයක් වේ නම්, ගෙවන මුදලින් යම් ප්‍රතිශතයක් එම වගකීම් සහ යම් සවි කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතා ආවරණය කිරීම සඳහා රඳවා තබා ගැනීමේ මුදලක් වශයෙන් තබාගත හැකිය.

මෙම කාර්යය සාධන සුරක්ෂණය මෙම කාර්යය සංග්‍රහයේ දැක්වෙන ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු අතර, එම සහතිකය වැඩ නිම කිරීම හෝ භාණ්ඩ සැපයුම නිම කිරීමට හෝ නියමිත දිනයෙන් ඔබ්බට දින 28 ක් දක්වා වලංගු විය යුතුය.

පහත සඳහන් නියෝජ්‍යාතන විසින් නිකුත් කරනු ලබන අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණ පිළිගනු ලබන නමුත්, ප්‍රථම ලිඛිත ඉල්ලීම ලද විගස සහතික කළ මුදල ගෙවීම සහ මුදල් ප්‍රමාණයේ වලංගුභාවය පිළිබඳව මෙම කාර්යය සංග්‍රහයේ පළකර ඇති ආකෘතියෙහි අන්තර්ගතයෙන් දැඩි බැහැරවීමකින් තොරව එම සහතික ඉදිරිපත් කොට තිබිය යුතුය.

- ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක්,
- වෙනත් රටක මුලාශ්‍රිත බැංකුවක්, නමුත් සුරක්ෂණ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක බැංකුවක් විසින් 'තහවුරු' කර තිබිය යුතුය.

කෙසේ වෙතත්, සුරක්ෂණ නිකුත් කරන අස්ථිත්වය විදේශීය රජයක අපනයන ණය නියෝජ්‍යායතනයක් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි ජාත්‍යන්තර මූල්‍ය ආයතනයක් නම් වෙනත් රටක පිහිටි බැංකුවක් විසින් නිකුත් කරන කාර්යය සාධන සුරක්ෂණ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් තහවුරු කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

- ඉදිකිරීම් පිළිබඳ සුරක්ෂණ අරමුදල :
- රක්ෂණ නියෝජ්‍යායතනයන් :

කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීම සඳහා නියමිත කාල සීමාවේ දීර්ඝ කිරීමක් සිදුවීමේදී, මෙම සුරක්ෂණය දීර්ඝ කර දෙන ලෙස ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් කොන්ත්‍රාත්කරු වෙතින් ඉල්ලා සිටිය යුතුය. එබඳු ඉල්ලීමක් ලිඛිතව කළයුතු වන අතර, සුරක්ෂණයෙන් තහවුරු කර ඇති කල් ඉකුත්වීමේ දිනයට පෙර එය කිරීමට ප්‍රසම්පාදන අස්ථිත්වය වගබලා ගතයුතුය.